# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වන නිවාස සංකීර්ණවල ප්‍රතිලාභීන් සඳහා වූ පොදු දේපල පරිහරණය කිරීමට අදාළ මාර්ගෝපදේශන අත්වැල



මහල් නිවාස වල ජීවත්ව පුරුදු හෝ නුපුරුදු සෑම දෙනාටම තමන්ට ලැබෙන ඉඩ කඩ බුද්ධිමත්ව කළමනාකරණය කර ගැනීමෙන් මනස්කාන්ත වටපිටාවක් සහිත අලංකාර නිවසක ජීවත් වීමේ භාග්‍යය දැන් ඔබ සැමට හිමිව ඇත.

## මහල් නිවාස සංකීර්ණයක ප්‍රතිලාභියෙකු වන ඔබ දැනගතයුතු දේ....

1. සෝපාන (ලිෆ්ට්) භාවිතා කිරීම
2. සඳළුතල (බැල්කනිය) පාවිච්චි කිරීම
3. විදුලි බලය අරපිරිමැස්මෙන් හා සුරක්‍ෂතව භාවිතා කිරීම
4. මුළුතැන්ගෙය භාවිතා කිරීම.
5. උදුන් භාවිතය
6. නිවසේ කුණු කසල ඉවත් කිරීම
7. නිවසේ නානකාමරය හා වැසිකිළිය භාවිතා කිරීම
8. සුරතල් සතුන් ඇති කිරීම
9. අනෙකුත් ප්‍රතිලාභීන්ට බාධාවක් නොවී ජීවත්වීම
10. පොදු ස්ථාන වල හැසිරීම හා භාවිතය
11. කොරිඩෝව භාවිතා කිරීම

## ඔබට පොදුවේ ලැබෙන දෑ සහ සේවාවන්

1. ප්‍රජා ශාලාව
2. පෙර පාසල
3. දිවාසුරැකුම් මධ්‍යස්ථාන
4. වාහන නැවතුම් අංගණය
5. සුපිරි වෙළඳ සංකීර්ණය සහ අනෙකුත් වාණිජමය සේවා

# 1. සෝපානය භාවිතා කිරීම




බිම් මහලේ සිට ඉහළ මහල දක්වා දිවා රෑ ක්‍රියාත්මක වන සෝපාන (ලිෆ්ට්) සේවාවක් ඔබට ලැබී ඇත.

සෝපානය ගෙන්වා ගැනීමේ බොත්තම වරක් තදකර එය තමන්ගේ මහලට එනතුරු ඉවසිලිමත්ව සිටීමට ඔබ පුරුදු විය යුතුය.

සෝපානය හැකි තරම් අඩු වාර ගණනක් දෛනිකව භාවිතා කිරීමට කටයුතු කල යුතුය.

උදා : නිවසට අවශ්‍ය ද්‍රව්‍ය එකවර රැගෙන ඒමට සැලසුම් කිරීම.

තවද, කාර්යබහුල වේලාවන්හීදී විශාල අයිතමයන් සෝපාන තුලට පැටවීම, බෑම හා ප්‍රවාහනය සැලසුම් නොකල යුතු වේ.



කෙටි දුර ප්‍රමාණයක් ගමන් කරන සෑම විටම පඩිපෙළ භාවිතා කිරීමෙන් ඔබටත් අන් අයටත් පහසුවක් සැලසේ.

සෝපානයෙහි ප්‍රමාණයට වඩා විශාල ද්‍රව්‍ය හෝ සටහන් කර ඇති ධාරිතාවය ඉක්මවා යන පරිදි ද්‍රව්‍ය පැටවීමට කිසිවිටෙකත් උත්සාහ නොකල යුතුය. එබඳු ද්‍රව්‍ය පඩිපෙල ඔස්සේ ප්‍රවේශමින් රැගෙන යාමට කටයුතු කල යුතුය.

සෝපානයේ ධාරිතාවය ඉක්මවා ඇති අවස්ථාවේදී නාද වන සීනුවට අවනත වෙමින් වැඩිපුර සිටින මඟීන් ඉක්මනින් ඉවත්වීමෙන් ප්‍රමාදවීම් වලක්වාගත හැකිය.

සෝපානය ඇතුළත, දුම්බීමෙන්, කෙළ ගැසීමෙන් හෝ වෙනත් අයුරින් අපවිත්‍ර කිරීම සිදු නොකළ යුතුයි.

සෝපානයේ කණ්නාඩියට හේත්තුවීමෙන් හෝ වෙනත් අයුරකින් හානි සිදු නොකළ යුතුයි.



එමෙන්ම මහල්වලට අදාල බොත්තම් තදකරගෙන සිටීම ඒවාට හානි කිරීම හා වැඩිවේලාවක් විදුලි සෝපානය එකම මහලතුල බොත්තම් එබීම මගින් රදවා තැබීම නොකල යුතුය. හදිසි ගින්නකදී හෝ වෙන යම් හදිසි ආපදා තත්වයකදී සෝපානය කිසිවිටෙකත් භාවිතා නොකළ යුතු අතර පඩිපෙළ පමණක් භාවිතා කරමින් හැකි ඉක්මනින් ගොඩනැගිල්ලෙන් පිටතට පැමිණිය යුතුයි.

## 2. සදළුතලය (බැල්කනිය) පාවිච්චි කිරීම

සදළුතලයක් (බැල්කනියක්) දී ඇත්තේ නිවස තුලට නිවසට හොඳ වාතාශ්‍රයක්, හිරු එළිය, අවට පරිසරයේ සිරි විඳගැනීමේ හැකියාව ලබාදීම වෙනුවෙනි. එබැවින් එම ප්‍රදේශය පිලිවෙලට තබාගැනීම ඔබගේ යුතුකමකි.





තෙත් ඇඳුම් පැලඳුම් හෝ එවැනි ද්‍රව්‍ය වේලීම සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවකදී බැල්කනිය භාවිතා කළ හැකිවේ. නමුත් අපිළිවෙලකට රෙදි වැල් ආදිය භාවිතා කරමින් ඇඳුම් පැලඳුම් වේලීම සිදු කිරීමෙන් මුළු නිවාස සංකීර්ණයම අවලස්සන වීමේ හැකියාවක් පවතී. එබැවින් ගොඩනැගිල්ලෙන් පිටතට නොපෙනෙන ආකාරයකට ඇඳුම් රාක්ක මත ඇඳුම් පැලඳුම් තබා ගැනීම නිවැසියන්ගේ වගකීමක් වන්නේය. තවද එවැනි භාවිතයන්හීදී

ගොඩනැගිල්ල හා අවට ප්‍රදේශයේ සුළඟේ බලපෑම සම්බන්ධයෙන්ද නිරන්තර සිහි තබා ගත යුතුය.

තවද ඉහළ සිට පැමිණෙන සේවා නල යොදා ගනිමින් රෙදි වැල් ගැටගැසීම හෝ වෙනත් කිසිදු කාර්යයක් වෙනුවෙන් එම නල ආධාරක ලෙස යොදා නොගතයුතු අතර එසේ යොදා ගතහොත් මුලු ගොඩනැගිල්ලේම පද්ධති වල ක්‍රියාකාරීත්වයට එයින් බලපෑම් එල්ල විය හැකි බැවින් එවැනි ක්‍රියා සිදුකරන පුද්ගලයන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුවට සිදුවනු ඇත.





සඳළුතලයෙහි බැම් මත කුඩා දරුවන් ඉන්දවීම, ඔවුන්ට ඉහලට නැගීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙන සේ ද්‍රව්‍ය හා උපකරණ තැබීම කිසිසේත් නොකළ යුතුය.

සඳළුතලයේ බැම් මත මල් පෝච්චි හෝ වෙනත් කිසියම් ද්‍රව්‍යයක් තාවකාලිකව හෝ රඳවා තබා ගැනීමෙන් වැලකිය යුතුය.


සඳළුතලයේ සිට ඉවතට කෙල ගැසීම, ජලය හෝ වෙනත් අපද්‍රව්‍ය, කසල විසිකිරීම කිසිසේත්ම සිදු නොකල යුතුය. එවැනි ක්‍රියා සිදුකරන පුද්ගලයන් හදුනාගෙන ඔවුන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුව කටයුතු කරනු ඇත.



සදලුතලයෙහි කිසිඳු තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ නවීකරණයක් සිදු කිරීමක් සිදු නොකල යුතු අතර එවැනි අවශ්‍යතාවයක් වේනම් කළමනාකරණ කමිටුවෙන් ලිඛිත අවසරයක් ලබා ගැනීම අනිවාර්යය වේ. එවැනි ක්‍රියා අනවසරයෙන් සිදුකරන පුද්ගලයන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුව කටයුතු කරනු ඇත.

සෑමවිටම සදළුතලයේ ගෙබිම පිරිසිදුව හා වියලිව තබාගැනීම නිවැසියන්ගේ සහ අනෙකුත් ප්‍රතිලාභීන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට හේතුවනු ඇත.

## 3. විදුලි බලය අරපිරිමැස්මෙන් හා සුරක්ෂිතව භාවිතා කිරීම



අනවශ්‍ය විදුලි පහන් නිවා දමා අරපිරිමැස්මෙන් විදුලිය භාවිතා කළ යුතුය. සාමාන්‍ය විදුලි බල්බ වෙනුවට LED හෝ CFL බල්බ භාවිතා කිරීම යෝග්‍ය වේ.



තම නිවසේ ට්‍රිප් ස්විචය (Recidual Current Circuit Breaker) නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ දැයි මසකට වරක්වත් පරීක්‍ෂා කළ යුතුය.

සුදුසුකම් ලත් පුද්ගලයෙකු ලවා විදුලි පරිපථ පද්ධතියේ පරීක්ෂා කටයුතු හා සුළු නඩත්තු කටයුතු සිදු කිරීම

හැරුණු කොට කිසිදු වෙනස් කිරීමක් හෝ නවීකරණයක් සිදු කිරීමෙන් වැලකිය යුතුය. එවැනි අනවසර ක්‍රියා සිදුකරන පුද්ගලයන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුව කටයුතු කරනු ඇත.

විදුලි උපකරණ භාවිතයේදී එක් එක් විදුලි ඇගයුමට (power rating) අදාල කෙවෙනි පමණක් භාවිතා කළ යුතුය.

නිවස තුල ගෘහ උපකරණ නොවන වෙනත් අධික විදුලි ධාරාවන් ලබා ගන්නා උපකරණ (උදා : කාර්මික යන්ත්‍ර සූත්‍ර ) භාවිතා කිරීම කිසිවිටෙකත් සිදු නොකල යුතුවේ.

## 4. මුළුතැන්ගෙය භාවිතා කිරීම



මුළුතැන්ගෙයෙහි බේසම (Sink) තුලට ඉතිරි ආහාර ද්‍රව්‍ය හෝ අනෙකුත් බාහිර ඝන ද්‍රව්‍යයන් දැමීමෙන් වැලකිය යුතුය. මේ සඳහා බේසම තුල පෙරනයක් (strainer) රදවා තැබීම කල යුතු අතර එහි රැඳෙන ඝන ද්‍රව්‍යය අනෙකුත් අප ද්‍රව්‍ය සමඟ බැහැර කිරීම සිදු කළ හැක.

එබඳු ද්‍රව්‍ය අපවහන පද්ධතියට එක්කිරීම තුළින් මලාපවහන පද්ධතියට සහ අපජල පවිත්‍රාගාරයට දැඩි හානි සිදුවිය හැකි අතර එබඳු ක්‍රියා සිදු කරන ප්‍රතිලාභීන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුව ක්‍රියා කරනු ඇත.



# 5. උදුන් භාවිතය





ද්‍රව පෙට්‍රෝලියම් වායු උඳුන් (ගෑස් උදුන්) භාවිතා කිරීමේදී ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට අනුකූලව වායු සිලින්ඩරය මුළුතැන්ගෙයින් පිටත තබා ගැනීම සිදු කළ යුතුය. තවද, එය භාවිතා කිරීමට ප්‍රථම හොඳින් වාතාශ්‍රය ලැබෙන සේ දොර ජනෙල් විවෘත කර තැබීම යෝග්‍ය වේ.




උදුනට සම්බන්ධ වන නල, රෙගියුලේටරය හා අදාල අයිතමයන් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂිතව භාවිතා කිරීම ප්‍රතිලාභියාගේ වගකීම වේ.

# 6. නිවසේ කසල හා අපද්‍රව්‍ය ඉවත් කිරීම



නිවසේ කසල භාජනවල වෙන් වෙන් වශයෙන් (ආහාර අපද්‍රව්‍ය, කඩදාසි, පොලිතීන් ) එකතු කිරීම සිදු කල යුතු අතර එසේ එකතු කරන ලද අපද්‍රව්‍ය අදාල පළාත් පාලන ආයතනයේ අපද්‍රව්‍ය ඉවත් කරන රථයට අදාල දිනයන්හීදී නියමිත වේලාවන්හි ලබාදිය යුතුය.



නිවසෙන් බැහැර කිසිම ස්ථානයක කසල එකතු කිරීම හෝ ගබඩා කිරීම සපුරා තහනම් වේ.

# 7. නිවසෙහි නාන කාමරය හා වැසිකිළය භාවිතා කිරීම

වැසිකිළිය හා නාන කාමරය පිරිසිදුව තබා ගැනීම නිවැසියන්ගේ වගකීමක් වන්නේය.






වැසිකිළි පෝච්චියට ඝන හෝ දියර අපද්‍රව්‍ය, බෙහෙත් හෝ වෙනත් රසායනිකයන්, සනීපාරක්ෂක තුවා වැනි අපද්‍රව්‍ය කිසිවිටක නොදැමිය යුතුයි. එම අපද්‍රව්‍ය නල තුල සිරවීම හේතුවෙන් සමස්ථ නිවාස සංකීර්ණයේම ප්‍රතිලාභීන් දැඩි අපහසුතාවන්ට පත්වනු ඇත.



වැසිකිළිය හා අදාල උපකරණ වැරදි ලෙස භාවිතා කිරීමෙන් සිදුවන හානි සම්බන්ධයෙන් කළමනාකරණ කමිටුව කිසිඳු වගකීමක් නොදරනු ඇත.



තවද නාන කාමරයේ බිත්ති හා පොළවට හානියක් සිදු නොකළ යුතුය. එසේ වුවහොත් ජල වලට හානි සිදුවී ජලය කාන්දු වීම නිසා යාබද නිවාස වලට පමණක් නොව ගොඩනැගිල්ලේ ව්‍යුහයටද බලපෑම්

එල්ල වන බැවින් එවැනි කාර්යයන් කිසිසේත් සිදු නොකළ යුතු අතර එසේ සිදුකළ හොත් අදාල ප්‍රතිලාභියාට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණ කමිටුවට සිදුවනු ඇත.

## 8. සුරතල් සතුන් ඇතිකිරීම







මෙම නිවාස සංකීර්ණය තුල කිසිඳු සුරතල් සතෙකු ඇති කිරීම කිසිසේත්ම සිදු නොකළ යුතුය. තවද කිසිඳු අවස්ථාවක නිවාස සංකීර්ණය තුලට ගෙන්වා ගැනීම මෙන්ම අයාලේ යන සතුන්හට ආහාර ලබාදීමද නොකල යුතු වන්නේය.

## 9. අනෙකුත් ප්‍රතිලාභීන්ට බාධාවක් නොවී ජීවත්වීම



තම දෛනික කටයුතු වලින් අසල්වැසි ප්‍රතිලාභීන්ගේ නිදහසට කිසිදු බාධාවක් සිදු නොවීමට වග බලා ගත යුතුය. තවද, රූපවාහිනී හා ගුවන් විදුලි යන්ත්‍ර හා අනෙකුත් ගෘහ උපකරණ වල ශබ්දය අවට නිවෙස් වලට කරදරයක් නොවන පරිදි ඒවා භාවිතා කළ යුතුය.



සාද, උත්සව, රැස්වීම් හෝ වෙළඳ, වාණිජමය කටයුතු සඳහා නිවාස හෝ කොරිඩෝව භාවිතා නොකළ යුතු වන අතර එම කළමනාකරණ සංස්ථාවේ අභිමතය පරිදි නියමිත අනුමැතියට අදාලව ප්‍රජා ශාලාව භාවිතා කළ හැක.

## 10. පොදු ස්ථානවල හැසිරීම




පොදු ස්ථානවල කුණු කසල දැමීම හෝ කුඩා දරුවන්ගේ මළ අපවහන ස්ථාන ලෙස මෙම ස්ථාන කිසි විටෙකත් භාවිතා නොකල යුතුය. එවැනි අවස්ථාවක් නිරීක්ෂණය වේ නම් කළමණාකරන සංස්ථාවේ නියෝජිතයෙකු වෙත වහාම දැන්විය යුතුය.

මීට අමතරව පහත සඳහන් දෑ සිදු නොකළ යුතුය.





- ආරක්ෂක බැම්, තාප්ප හෝ පඩිපෙල මත ඉඳගැනීම.
- තවත් ප්‍රතිලාභියෙකු අපහසුතාවයට පත්වන සේ හැසිරීම හෝ අසංවර ලෙස හැසිරීම.

## 11. කොරිඩෝව භාවිතා කිරීම



කොරිඩෝව අවහිර වන පරිදි කිසිදු ද්‍රව්‍යයක් තැබීම සිදු නොකළ යුතු අතර කිසිදු ආකාරයකට කසළ හෝ වෙනත් භාවිතා කළ නොහැකි නිවෙස් වලින් ඉවත දමන ලද කැඩී බිඳී ගිය දෑ නොතැබිය යුතුය.



තවද, නිවසින් ඉවත දමන කුණු කසල නිවස ඉදිරිපිට ගොඩ ගැසීමටද අවසර නොමැත.

කොරිඩෝව තුල ක්‍රීඩා කටයුතු වල යෙදීමෙන් වැලකිය යුතු අතර එවැනි කටයුතු වලින් සිදුවන හානිවලට ප්‍රතිලාභියා පෞද්ගලිකව වගකිව යුතුවේ. කොරිඩෝවේ මල්පැල සිටවූ බඳුන් නොතැබිය යුතුයි. තම නිවස ඉදිරිපිට කොරිඩෝව පිරිසිදුව තබා ගැනීම සෑම ප්‍රතිලාභියෙකුගේම වගකීම වේ.

ප්‍රකාශන අංක 1

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

4 වන මහල, සෙත්සිරිපාය (1 අදියර),

බත්තරමුල්ල.

දුරකථන: 0112872283 , 0113355035